www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# බ්‍රිතාන්‍ය: රැජනගේ කථාවෙන් ව්‍යාපාර ගැති, කම්කරු විරෝධී ව්‍යවස්ථාමය න්‍යාය පත්‍රයක් ඉදිරිපත් කෙරෙයි

**Britain: Queen's speech announces pro-business anti-worker legislative agenda**

**2010 මැයි 26**

**ජීන් ෂෝල් විසිනි**

තම ප්‍රමුඛතාවය "අයවැය හිඟය කැපීම හා ආර්ථික වර්ධනය තහවුරු කිරීම" ලෙස සලකන තත්වාරක්ෂක ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යවස්ථාමය වැඩසටහනක් රැජනගේ කථාවෙන් නිවේදනය කරන ලදී. සරල භාෂාවෙන් මෙහි අර්ථය වන්නේ එය, ආන්ඩුව 24 දා නිවේදනය කල පවුම් බිලියන 6 ක අතිරේක වියදම් කප්පාදුවත් සමඟ ආරම්භ කෙරෙන කම්කරුවන්ගේ හා ඔවුන්ගේ පවුල් වල වියදමෙන් ව්‍යාපාරික ලාභ නැංවීමේ වැඩ සටහනක්ය යන්නයි.

25 දින රැජන සාමි මන්ත්‍රී මන්ඩලයේදී නව ආන්ඩුවේ යෝජනා ඉදිරිපත් කරමින් කියා සිටියේ, "මගේ ආන්ඩුවේ ව්‍යවස්ථාමය වැඩ සටහන පදනම් වනු ඇත්තේ නිදහස, සාධාරනත්වය හා වගකීම යන මූලධර්ම මත" බවයි.

"නිදහසේ" අර්ථය ලාභයේ නව මූලාශ්‍රයන් වෙත ව්‍යාපාරික ක්ෂේත්‍රයේ නිදහස් ප්‍රවිෂ්ටය වන අතර අසනීපවීම හෝ වයස්ගතවීම නිසා රැකියාවක නොයෙදෙන විට තම පැවැත්ම සඳහා වඩකරන මිනිසුන් වඩා වැඩි "වගකීමක්" බාරගතයුතු බවයි. "සාධාරනත්වය" යන්නෙහි අර්ථය මෙයයි.

අයවැයේ වගකීම භාරගන්නා (ඕබීආර්) ස්වාධීන යයි සැලකෙන ආයතනයක් හඳුන්වාදීම නව ආන්ඩුවේ වඩාත්ම වැදගත් පියවරයන්ගෙන් එකකි. අනාගතයේදී, ආන්ඩුවේ ආර්ථික හා මූල්‍ය සැලසුම් ද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන වාර්ෂික අයවැය ද පිලිබඳ පුරෝකථන ඉදිරිපත් කරනු ඇත්තේ භාන්ඩාගාරය නොව ඕබීආර් ආයතනයයි. ආන්ඩුවේ ප්‍රතිපත්ති එහි ඉලක්ක සපුරාගන්නවාද යන්න පිලිබඳව එය "උපදෙස්" ලබාදෙනු ඇත. ඒ සමඟම ඕබීආර් ආයතනය, අධ්‍යාපනය, සෞඛ්‍ය හෝ විශ්‍රාම වැටුප් සඳහා ගෙවීමට ආන්ඩුවට හැකියාවක් තිබේ ද හා බැංකුවල අනාගත ඇපදීම් සඳහා ගෙවීමට බදු වැඩිකිරීමේ අවශ්‍යතාවක් ඇත් ද යන්න තීන්දු කරනු ඇත.

ඕබීආර් හි ප්‍රධානත්වය දරන්නේ ඇලන් බඩ් සාමි, ජෙෆ්රි ඩික් හා ග්‍රේහැම් පාකර් යන තිදෙනාය. බඩ්, එංගලන්ත බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්ති කමිටුවේ ආරම්භක සාමාජිකයෙකි. ඩික්ස්, නෝවුස් කැපිටල්හි හිටපු ප්‍රධාන අර්ථශාස්ත්‍රඥ හා රෝයල් බැන්ක් ඔෆ් ඉන්ග්ලන්ඩ්හි හිටපු ප්‍රධාන අර්ථශාස්ත්‍රඥයා ය. පාකර්, භාන්ඩාගාරයේ පොදු මූල්‍ය කන්ඩායමේ හිටපු ප්‍රධානියාය.

වසර ගනනාවක් මූල්‍ය ප්‍රභූ පැලැන්තියේ අවශ්‍යතා තීරනය කර තිබෙන හා පීඩබ්ලිව්සී, මැකින්සි, ඩිලොයිටර්ස්, කේපීඅම්ජී වැනි ජාත්‍යන්තර මූල්‍ය උපදේශකයන් විසින් කලමනාකරනය කර තිබෙන, ප්‍රතිපත්ති සම්පාදනයේ පරිබාහිර මූලාශ්‍රකරනය, (outsourcing) දැන් ව්‍යවස්ථාපිත පදනමකට ගෙන තිබේ. ඕබීආර් හි සංයුතිය, මූල්‍ය ප්‍රභූවට දැන් ආන්ඩුවේ අනෙකුත් සියලු දෙපාර්තමේන්තු හා පොදු අරමුදල් පාලනය කරන්නාවූ භාන්ඩාගාරයේ සම්පූර්න පාලනය හිමිව තිබෙන බව සහතික කෙරෙයි. එය ස්වාධීන ආයතනයක් වීමේ අර්ථය වන්නේ, දැන් ඕබීආර් කුමන හෝ ප්‍රජාතන්ත්‍රවාදී පාලනයකින් හා නිරීක්ෂනයකින් ස්වාධීනව ඇති බවයි.

නව මූල්‍ය සේවා නියාමන පනත මඟින්, බැංකු පද්ධතිය පිලිබඳ නියාමනයේ හා පෞද්ගලික බැංකු නියාමනය මත "අධීක්ෂනය" පවත්වාගෙන යාමේ සම්පූර්න වගකීම එම ආයතනවලට පැවරෙන අතර මූල්‍ය සේවා අධිකාරියේ ක්‍රියාකලාපය පහත හෙලයි.

"රාජ්‍ය අංශය හා පුද්ගලයාගේ සමාජ වගකීම දිරිගැන්වීම මඟින් ශක්තිමත් හා සාධාරන සමාජයක් ගොඩනැඟීම සඳහා" ගන්නාවූ නව පියවර පිලිබඳව රැජනගේ ප්‍රකාශයෙන්, පොදු සේවාවන් හා ශුභසාධනය මත ආන්ඩුවේ ප්‍රහාරය පෙර ඇඟවුම් කරයි.

නව කම්කරු පක්ෂ ආන්ඩු යටතේ දැනටමත් ක්‍රියාවට නඟා ඇති පෘතුල පුද්ගලිකකරනය තව දුරටත් ව්‍යාප්ත කිරීම රාජ්‍ය අංශයේ ප්‍රතිසංස්කරනයන්ට ඇතුලත් වෙයි. අධ්‍යාපන ආයතන පිලිබඳ නව පනත මඟින්, ප්‍රථම වතාවට ප්‍රාථමික පාසැල් ද ඇතුලු සියලු පාසැල් වලට පුද්ගලික අංශයෙන් අරමුදල් සපයා ගැනීමේ අවස්ථාව හා පලාත් පාලන ආයතනවල පාලනයෙන් නිදහස් වීමේ අවස්ථාව සැලසෙනු ඇත. යම් අවම මට්ටමක අනුග්‍රාහකත්වයට හිලව් වශයෙන් පුද්ගලික අංශයට, පාසැල්වල පාලනය සියතට ගැනීමටත් පාසැල් පවත්වාගෙන යාම හා නඩත්තුව සඳහා මධ්‍යම ආන්ඩුවෙන් අරමුදල් ලබාගැනීමටත් හැකිවේ. ඒ අනුව ඔවුන්ට, තමන්ගේම විෂයමාලා සැකසීමට, වැටුප් හා ලමුන් ඇතුලත්කර ගැනීමේ ප්‍රතිපත්ති තීරනය කිරීමට "නිදහස" ලැබේ. පුද්ගලික අංශය විසින් පවත්වාගෙන යනු ලබන "නිදහස් පාසැල්" ගොඩනැඟීමට ඒ අනුව දෙමව්පියන්ට හා අනෙකුත් කන්ඩායම් වලට අවස්ථාව සැලසේ.

තවත් පනතකින්, විෂයමාලා පිලිබඳව පුලුල් නිදහසක් හා කරදරකාරී හා අසහනයට පත් සිසුන් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා පාසැල් වලට විශාල බලතල හිමිවෙයි. භාවිතයේදී මෙහි අර්ථය වනු ඇත්තේ, හාම්පුතුන්ගේ මඟපෙන්වීම යටතේ "වෘත්තීයමය පුහුනුව" කෙරෙහි වැඩි අවධානය යෙදීමත්, සිසුන් විනයගත කිරීම හා නෙරපා හැරීමත්ය.

පරිපාලන වියදම් තුනෙන් එකකින් කපාහැරීම අරමුනු කරගත්, ජාතික සෞඛ්‍ය සේවය ක්‍රියාත්මක කිරීම පිනිස නව ආකෘතියක් අවශ්‍ය කෙරෙයි.

ආන්ඩුව රාජකීය තැපැල පුද්ගලික ලංසුකරුවන්ට හා සේවක භාරකාර අරමුදලට විකුනා දැමීමේ සැලැස්ම දිගටම පෙරට ගෙනයනු ඇත. ජාතික සෞඛ්‍ය සේවය වැනි අර්ධ රාජ්‍ය ව්‍යවසායන් "නිලධාරිවාදය අවම කිරීමේ" කඩතුරාව යටතේ වසරකට පවුම් බිලියනයක් ඉතිරිකර ගනිමින් වෙනත් එවැනි ආයතන සමග ඒකාබද්ධ කරනු හෝ ඒවයේ බලතල සීමාකරනු ඇත. එයට අයත්වන්නේ කුමන ආයතන ද ඒවා ක්‍රියාත්මක වන්නේ කෙසේ ද යන්න ගැන ආන්ඩුව කිසිවක් පවසා නැත. ආන්ඩුවේ ප්‍රහාරයට ලක්වන්නේ රාජ්‍ය සේවය පමනක් නොවේ. ඊට සමාජ රක්ෂන ක්‍රමය ද ඇතුලත්ය. නව ශුභසාධන ප්‍රතිසංස්කරන පනත "වැඩ දිරිගැන්වීම් ප්‍රවර්ධනය" සඳහාවූ සහනාධාර ක්‍රමය සරල කරනු ඇත. ඒ සමඟම වැඩ සඳහා විවිධ සහනාධාර වැඩ සටහන් එක් ක්‍රමයක් යටතට ගෙන එනු ඇත. එය විරැකියා සහනාධාර සඳහා වන අයිතිය හා හිමිකමක් ලෙස පවතින ආදායම් සහනය ඉවත් කරන අතර ඒ වෙනුවට පවරන කුමන හෝ රාජකාරියක් ඉටුකිරීමට දක්වන කැමැත්ත මත එය සලකා බලනු ඇත. මෙහි අරමුන වන්නේ, මිලියන 5 කටත් අධික රැකියා විරහිත, දිගු කලක් රෝගීව සිටින, ආබාධිත හා දෙමාපියන්ගෙන් එක් අයෙක් පමනක් සිටින මිනිසුන් ගේ සහනාධාර ඉවත්කර බොහෝකොටම අඩු වැටුප් හෝ අර්ධ කාලීන රැකියාවන්ට තල්ලු කිරීමයි. පවත්නා විශ්‍රාම වැටුප් ක්‍රමය අවලංගු කරන නව නීති යටතේ රජයේ විශ්‍රාම වයස් සීමාව අවුරුදු 66 දක්වා ඉහල නංවන අතර තවදුරටත් විශ්‍රාම වැටුප් ක්‍රමය විමසුමට ලක්වෙයි.

විශාල සෝෂාවක් මධ්‍යයේ ආන්ඩුව, රජයේ විශ්‍රාම වැටුප් හා සාමාන්‍ය වැටුම් මට්ටම අතර පුරුකක් නිර්මානය කිරීමට සැරසෙයි. ඒ අනුව රජයේ විශ්‍රාම දීමනාව සාමාන්‍ය වැටුපෙන් සියයට 25 දක්වා පහත වැටේ. වෘත්තීය විශ්‍රාම වැටුපක් නොලබන හෝ ඉතා කුඩා වැටුපක් ලබන හා පැවැත්ම සඳහා ආදායම් සහන මත යැපෙන අයට විශ්‍රාම දීමනාවක් හිමිවෙයි. මේ මිනුම අනුව තනි පුද්ගලයෙකුට සතියකට සොච්චම් අනුපාතයක් වන පවුම් 95.25 ක් හා යුවලකට පවුම් 152.30 ක් ලැබෙනු ඇත. එය ද ලැබෙනු ඇත්තේ ජාතික රක්ෂනයට නියමිත වසර ගනනක් තුල දායක මුදල් ගෙවා ඇත්නම් පමනි.

ජාතික රක්ෂන දායකත්වය පිලිබඳ පනත යටතේ මීට පෙර හාම්පුතුන්ගේ දායකත්වය සියයට එකකින් වැඩිකිරීමට ගෙන තිබූ තීන්දුව ව්‍යාපාරිකයන්ගේ විරුද්ධත්වය හමුවේ අකුලාගෙන ඇති නමුත් කම්කරුවන් වැඩිවන ඔවුන්ගේ දායකත්වය ගෙවිය යුතුය. මෙයින් උපයාගන්නා පවුම් බිලියන 9 ආදායම් බදු පුද්ගල දීමනා ඉහල නැංවීමටත් ජාතික රක්ෂන දායකත්වයේ අවමය වැඩි කිරීමටත් යොදවනු ඇත. විශ්‍රාම වැටුප්ද ඇතුලුව ජාතික රක්ෂන අරමුදල ගෙවන සහන සීමාකිරීම කැපී පෙනෙයි.

වර්ගවාදය හා ස්වෝත්තමවාදය ඇවිස්සීමේ අරමුන සහිත පියවරක් වන යුරෝපීය සංගමයට අයත් රටවලට පිටින් වාර්ෂිකව බ්‍රිතාන්‍යට ඇතුලුවන සංක්‍රමනිකයන් සංඛ්‍යාව සීමාකිරීමට ආන්ඩුව පියවර ගනු ඇත. මෙය වක්‍ර ආකාරයෙන් රටතුල වැටුප් ඉහලට තල්ලු කෙරෙන පීඩනයක් බවට පත්වීම වැලැක්වීම සඳහා "නම්‍යශීලී වැඩ රටාවකට" පවතින බාධක ඉවත් කිරීම හා ''සමාන වැටුප්'' ප්‍රචලිත කිරීමේ සැලසුම් සකස් කෙරේ. "ජාතික ආරක්ෂාව" තර කිරීමටත්, සංක්‍රමනිකයන් පාලනය ශක්තිමත් කිරීමටත්, මිනිසුන්, ආයුධ හා මත් ද්‍රව්‍ය ප්‍රවාහනය මැඩපැවැත්වීමටත් සංවිධානාත්මක බරපතල අපරාධ ඒජන්සිය ප්‍රතිසංවිධානය කිරීමේ කොටසක් ලෙස කැපවුනු දේශසීමා පොලිස් බලකායක් ගොඩනගනු ඇත.

ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදීන් සමග ඇතිකරගත් එකඟත්වයේ කොටසක් ලෙස ව්‍යාපාරික හිතවාදී කප්පාදු වැඩ සටහන ප්‍රජාතන්ත්‍රවාදී සලුපිලි වලින් සැරසීම පිනිස නාමික පියවර ආන්ඩුව විසින් ගනු

ඇත. කොන්සර්වේටිව් පාක්ෂිකයන්ගේ විරුද්ධත්වය පලවියහැකි නමුත් පාර්ලිමේන්තුව සඳහා විකල්ප ඡන්ද ක්‍රමයක් හඳුන්වාදීම පිනිස ආන්ඩුව ජනමත විචාරනයක් පවත්වනු ඇත. සංඛ්‍යාවෙන් අඩු හා ප්‍රමානයෙන් වඩා සමාන මැතිවරන කොට්ඨාශ හඳුන්වාදෙනු ඇත. පාර්ලිමේන්තුවේ වියදම් සෝලියක් හමුවේ බරපතල අකටයුතුකම් පිලිබඳව වැරදිකරුවන් යයි පෙනී යන මන්ත්‍රීවරුන් නෙරපීමට ඡන්දදායකයන්ට හැකියාව ලැබෙනු ඇත.

සම්ප්‍රධායික සරල බහුතරයක් වෙනුවට ආන්ඩුවක් බලයෙන් පහ කිරීම සඳහා විශ්වාස භංගයක් ගෙන ඒමට මන්ත්‍රීවරුන්ගෙන් සියයට 55 ක බහුතරයක් අවශ්‍ය කෙරෙන සංශෝධන ආන්ඩුව ගෙන එන්නේ නොකඩවා වසර පහක් පවත්නා පාර්ලිමේන්තු ඇතිකිරීම සඳහා ය. මේ මගින් සුලුතරයේ කොන්සර්වේටිව් ආන්ඩුව බලයේ රැඳෙන බව සහතික වනු ඇත.

හැඳුනුම්පත්, ජාතික හැඳුනුම්පත් ලේඛනයක් හා මතු පරපුර සඳහා ජෛවමිතික විදේශ ගමන් බලපත්‍ර හඳුන්වාදීමට ලේබර් ආන්ඩුව ගෙනආ සැලැස්ම නව ආන්ඩුව විසින් අහෝසිකරනු ඇත. බ්‍රිතාන්‍යයේ තරම් ලෝකයේ වෙනත් කිසිම රටක භාවිතයට නොගන්නා සීසීටීවී කැමරා භාවිතය පිලිබඳ රෙගුලාසි "දැඩි කිරීමටත්" අහිංසක මිනිසුන්ගේ ඩීඑන්ඒ වාර්තා ජාතික දත්ත බැංකුවේ රඳවා ගැනීමට පොලිසියට ලැබෙන කාලය "සීමාකිරීමටත්" එය පොරොන්දු වෙයි. විරෝධතා දැක්වීමේ අයිතිය මත පනවා තිබෙන සමහර සීමාවන් ද ඇතුලුව ලේබර් ආන්ඩුව යටතේ කප්පාදු කල සමහර සිවිල් අයිතීන් යලි තහවුරු කිරීමට ද ආන්ඩුව ප්‍රතිඥා දෙයි. කෙසේ වුවත් රජන මෙම ප්‍රකාශය කර පැය ගනනක් ඉකුත්වීමටත් පෙර පාර්ලිමේන්තු චතුරස්‍රයේ කඳවුරුලා සිටි යුද විරෝධියෙක් වන බ්‍රයන් හොව් හා තවත් අයෙක් අත්අඩංගුවට ගනු ලැබිනි.

නව පොලිස් ප්‍රතිසංස්කරන පනත යටතේ ආන්ඩුව එක්සත් ජනපදයේ ක්‍රියාත්මක කර තිබෙන ආකාරයේ පොලිස් කොමසාරිස් වරුන් කෙලින්ම තෝරාපත්කරගන්නා ක්‍රමයක් හඳුන්වා දෙනු ඇත.

එවන් ඇස් බැන්දුම්, කම්කරු පන්තියේ සමාජ තත්වය මත පුලුල් ප්‍රහාර එල්ල කිරීමේ අරමුන තුල මුල්බැස තිබෙන මර්දනකාරී පියවර දැඩිකිරීමෙන් ආන්ඩුව වලක්වනු නැත.

© www.wsws.org